මගේ අංකය : JSC/SEC/CIR/2025

**සියලුම අධිකරණ නිලධාරීන් වෙත,**

**<u>අධිකරණ මඟින් මහජනතාව වෙත භාර දීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙත එවනු ලබන සිතාසි සම්බන්ධව</u>**

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (ඉංජිනේරු) විසින් 2024.11.05 දිනැති ආවරණ ලිපිය සමඟ යොමු කර ඇති පඩුවස්නුවර ප්‍රාදේශීය ලේකම් විසින් කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කර ඇති DIVPE/ADM/GRAMA/3/2/30 හා 2024.05.22 දිනැති ලිපිය (පිටපත් අමුණා ඇත) පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පලකොට එම ලිපියෙහි අන්තර්ගත කරුණු ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 ජනවාරි මස 24 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ANNEXE M

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி, பொதுநிருவாக, உள்நாட்டலுவல்கள், மாகாணசபை கள், உள்ளூராட்சிமற்றும்தொழில்அமைச்சு
Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour

අධිකරණ අංශය
நீதிப்பிரிவு
Justice Division

නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
இல19 ஸ்ரீசங்கராஜ மாவத்த, கொழும்பு 10, இலங்கை.
No 19, Sri Sangaraja Mawatha, Colombo 10, Sri Lanka

මගේ අංකය / எனது இல / My No: MOJ/L13/JSC/2023

ඔබේ අංකය / உமதுஇல / Your No:

දිනය / Date: 2024.11.05

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

කොළඹ 12

JUDICIAL SERVICE COMMISSION SECRETARIAT - COLOMBO 12
07 NOV 2024

**ගරු අධිකරණය මගින් මහජනතාව වෙත භාර දීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙත එවනු ලබන සිතාසි සම්බන්ධව**

උක්ත කරුණ සම්බන්ධයෙන් පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් විසින්, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කරන ලද අංක DIVPE/ADM/GRAMA/3/2/30 හා 2024.05.22 දිනැති ලිපිය, කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් අංක DSKU/ADM/ES/GRAMA/4/4/40 හා 2024.10.018 දිනැතිව මෙම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. ඔබගේ පහසු දැන ගැනීම සඳහා අදාළ ලිපිවල පිටපත් අමුණා ඇත.

2) එමගින් ගරු අධිකරණය මගින් විත්තිකරුවන් හා පැමිණිලිකරුවන් වෙත එවනු ලබන සිතාසි ආපසු යැවීම සඳහා ලැබෙන මුද්දර ගාස්තු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත.

3) එම ලිපිය ඔබගේ අවධානයට හා අවශ්‍ය කටයුතු සඳහා මේ සමග කාරුණිකව යොමු කරමි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන
සහ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

පිටපත - දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල

දුරකථන / தொலைபேசி / Telephone 011-2323022 / 011-2449959
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2320785
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail info@moj.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.moj.gov.lk

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල
மாவட்டச்செயலகம் - குருநாகல்
DISTRICT SECRETARIAT- KURUNEGALA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No | DSKU/ADM/ES/GRAMA/4/1/40 | |
| ඔබේ අංකය / உமது இலக்கம் / Your No | | |
| දිනය / திகதி / Date | 2024.10.28 | |

ලේකම්,
අධිකරණ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය,
නො 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

**ගරු අධිකරණය මඟින් මහජනතාව වෙත භාර දීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙත එවනු ලබන සිතාසි සම්බන්ධව**

උක්ත කරුණ සම්බන්ධව පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම්ගේ අංක DIVPE/ADM/ES/GRAMA/3/2/30 සහ 2024.05.27 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින් ගරු අධිකරණය මඟින් විත්තිකරුවන් හා පැමිණිලිකරුවන් වෙත එවනු ලබන සිතාසි ආපසු යැවීම සඳහා ලැබෙන මුද්දර ගාස්තු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මුහුණ පෑමට සිදු වන දුෂ්කරතා සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත.

03.එබැවින් එම ලිපිය අවශ්‍ය කටයුතු සඳහා කාරුණිකව මේ සමඟ යොමු කරමි.

අ/කලේ- ආර්.එම්.ආර්.රත්නායක
කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්/දිසාපති හා
ස්වදේශ කටයුතු අතිරේක ලේකම්.

ඩබ්.ජී.එස්. වාසලමුණි
සහකාර දිස්ත්‍රික් ලේකම්

දුරකථන අංකය : 037-2226253
ෆැක්ස් අංකය : 037-2222926
විද්‍යුත් ලිපිනය : moha.dist.kurunegala@gmail.com

නීති අංශය
29 OCT 2024

පිටපත - 1.ප්‍රාදේශීය ලේකම්, පඩුවස්නුවර නැගෙනහිර - කා.දැ.ගැ.පි

(සිං)

DIVP/ADM/LS/GRAMA/2024 | ඔබේ අංකය / உ.எனது இல / Your No | දිනය / திகதி / Date — 2024.05.

දිස්ත්‍රික් ලේකම්/දිසාපති මගින්,

ලේකම්,
අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නො.19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

<u>ගරු අධිකරණ මගින් මහජනතාව වෙත භාරදීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙත එවනු ලබන සිතාසි සම්බන්ධවයි.</u>

ගරු අධිකරණ මගින් විත්තිකරුවන් සහ පැමිණිලිකරුවන් වෙත භාර දීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙත එවනු ලබන සිතාසිවලට අදාල පුද්ගලයින් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචිව නොසිටීම හේතුවෙන් ඇතැම් අවස්ථාවලදී එම ලිපි කට්ටලයට අමතර ලේඛන එකතුකර තැපැල් කරලීමට සිදු වේ.

02. එවන් අවස්ථාවලදී අධිකරණය විසින් ආපසු යැවීම සඳහා එවනු ලබන මුද්දර කවරයේ මුද්දරවල ගාස්තු ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අදාල නොවන ලිපි කට්ටල ආපසු යැවීමේදී එම මුදල් තැපැල් ලාප්නාරී කරනු ලබන කාර්යාල කාර්ය සහායකවරුන්ට ගෙවීමට සිදුවේ.

03. එබැවින් ගරු අධිකරණ විසින් එවනු ලබන සිතාසිවල බර ප්‍රමාණයට අදාල සම්පූර්ණ මුද්දර ප්‍රමාණය සමඟ එවීමට අවශ්‍ය උපදෙස් සියළුම අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

O/C

ප්‍රාදේශීය ලේකම්
පඩුවස්නුවර නැගෙනහිර

**ජී.ජී.එස්.ජේ.ද සොයිසා**
**ප්‍රාදේශීය ලේකම්**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
**පඩුවස්නුවර නැගෙනහිර**

මාවී ඇළ, මොරගනේ. மாவீஎல, மொரகனே. Mavee-Ela, Moragane.
TP-0377294228 Fax-0373123160 pandeast_acc@yahoo.com